# කම්මැලි මී මැස්සා



H.M.D.N.දෙව්දුනි හේරත්

කෘතියේ නම - කම්මැලි මී මැස්සා

ප්‍රථම මුද්‍රණය - 2025.02.08

කතාව සහ චිත්‍ර - එච්.එම්.ඩී.එන්.දෙව්දුනි හේරත්

කතෘගේ ලිපිනය - 179/21, පට්ටියකැලේ වත්ත, අම්පිටිය

පාසල - මහ/ හේමමාලි බාලිකා විද්‍යාලය

ශ්‍රේණිය - 6 ශ්‍රේණිය C

පරිගණක අක්ෂර සහ පිටු සැකසුම - ''ඕෂධි කමියුනිකේෂන්''
නො.2G , සීගෝප්ලාසා,
තලාතුඔය.

ISBN : 978-624-208-443-5



# පිදුම

මා හට ගුරුහරුකම් ලබා දෙමින් මඟ පෙන්වමින්,

මා අසලින්ම සිටි, මාගේ මෑණියන්ටත්,

මාගේ පියාණන්ටත්, මා හට ශිල්ප දුන් සියලු

ගුරු වරුන්ටත්

විදුහල්පතිතුමියටත්,

මාගේ ආදරණීය හේමමාලි බාලිකා අම්මාටත්,

මගේ පොත ආදරයෙන්

පුදමි !



## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන


"හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධිර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.




ඔන්න එක ගහක
මී වදයක් තිබුණා.
මේ මීවදයේ
මී මැස්සෝ
හරිම කඩිසරයි.


හැබැයි එක මී මැස්සෙක්
පොඩ්ඩක්වත් කඩිසර නෑ.

හරිම
කම්මැලියි.




හැමදාම උදේට මේ මී මැසි රංචුව
මී පැණි හොයන්න
යනවා.






හැබැයි අර කම්මැලි මී මැස්සා මී පැණි හොයන්න යන්නෑ.

අනිත් අයගෙන් මී පැණි බීලා ආයෙමත් නිදාගන්නවා.



ඔන්න හැබැයි එක දවසක් පුරුදු විදිහටම අනිත් අය ගෙනාපු මී පැණි බොන්න සූදානම් වුණා.



ඒ වුණත් අනිත් මී මැස්සෝ එයාට මී පැණි බොන්න දුන්නේ නෑ.


එයාලා මෙහෙම කිවුවා.

''එන්න එපා අපි ගෙනාපු මී පැණි බොන්න.

ඔයාට ඕනෙනං ගිහිං හොයාගන්න.''

කම්මැලි මී මැස්සා බැරිම
තැන මී වදයෙන් එළියට ගියා.






ඉතින් එයාට දැන් බඩගින්න ඉවසන්න බෑ. මෙයා ටික දුරක් යද්දී දකිනවා මහන්සි වී වැඩ කරන කූඹි රැළක්.

එයා කූඹින්ගෙන් අහනවා

''ඇයි ඔයාලා හැමෝම මහන්සි වෙලා වැඩ කරන්නේ ? ''

කූඹි රැළ කියනවා ''හැමෝම එකතු වුණාම වැඩ කරන්න හරිම පහසුයි.''



මී මැස්සාට එයාලාගෙ කතාව අහලා ලැජ්ජා හිතෙනවා. මෙයා බඩගින්නෙම තව ටික දුරක් පියාඹනවා.


ටික දුරක් යනකොට මල්වල එල්ලෙමින් පැණි බොන සමනල රංචුවක් දකිනවා.

මී මැස්සා එයාලාගෙනුත්


අහනවා, ''ඇයි ඔයාලා එකට කෑම හොයන්නේ''

''එහෙම උණහම අපිට කෑම හොයන්න වාගේම අනිත් අයව බලාගන්නත් පුළුවන්නේ..''


මී මැස්සා නැවතෙමින් මෙහෙම හිතුවා.



''අද ඉදන් මාත් මගේ පවුලේ අය වෙනුවෙන් කෑම හොයන්න ඕන. එයා අදිටන් කර ගත්තා.



මල් පැණි බීලා බඩ පුරවගත්ත
මී මැස්සා පවුලේ අයටත්
මී පැණි
ගෙනිච්චා.



බරට බරේ මී පැණි උස්සං එන
කම්මැලි මී මැස්සව දැක්ක
හැමෝටම
පුදුමයි



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව (2014) වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්
2025.02.08

**ISBN : 978-624-208-443-5**